**ප්‍රවාහණ ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම් (උතුරු කොළඹ වරාය සංවර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා) ව්‍යාපෘතිය -2020**

---

ප්‍රවාහණ ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම් (උතුරු කොළඹ වරාය සංවර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා) ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425-SRI (SF) දරන ණය ගිවිසුමේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගිවිසුම සහ ව්‍යාපෘති පරිපාලන සංග්‍රහයට අනුව, වරාය සහ නාවික අමාත්‍යාංශය විධායක නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ ප්‍රමුඛතා ප්‍රවාහණ ව්‍යාපෘතිවල සූදානම වැඩිදියුණු කිරීම වන අතර ණය ගිවිසුමේ ව්‍යාපෘති පරිපාලන සංග්‍රහයට අනුව, ජාතික වරාය මහා සැලැස්ම අනුගමනය කරමින් වරාය පහසුකම් සංවර්ධනය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහාය වේ. ණය ගිවිසුමට අනුව, එකඟ වූ මුළු ණය මුදල එස්ඩීආර් මිලියන 17.47 ක් වූ අතර ව්‍යාපෘති පරිපාලන සංග්‍රහයට අනුව, මෙම සංරචකයේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 729.65 කට සමාන එජඩො මිලියන 5 ක් වන අතර ඉන් රු.මිලියන 645.01 කට සමාන එජඩො මිලියන 4.42 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2016 ඔක්තෝබර් 28 දින සිට මාස තුනකට පසුව ආරම්භ කිරීමට නියමිතව තිබුණද, සංරචකයේ ක්‍රියාකාරකම් 2018 වර්ෂයේ දී ආරම්භ කර 2022 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

**1.3 මතය**

---

2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ ඌනතාවය

| ගිණුම්කරණ ඌනතාව | මුදල<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2020 වර්ෂය සඳහා ව්‍යාපෘතියට ණය ලබා දීමට අදාළ පොළී වියදම මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන නොමැත | ශ්‍රී ලංකා රජය (GOSL) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) අතර ඇති කර ගන්නා ලද ණය ගිවිසුමට අනුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව (TOD) මගින් පොළිය ද ඇතුළුව ආපසු ගෙවීම් සිදු කරන ලදී. එම නිසා, පොළී වියදම් ව්‍යාපෘතිය මගින් හඳුනාගෙන නොමැත. | මෙම සංරචකයට අදාළ පොළිය ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කළ යුතුය. |

### 2.2. නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | තාක්ෂණික ආධාර ණය ගිවිසුමේ IV ඡේදයේ (විශේෂිත ගිවිසුම්) 4.01 වගන්තිය | 2016 ඔක්තෝම්බර් මාසයේදී ණය ගිවිසුම අත්සන් කළද, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලද්දේ 2018 වසරේදීය. ඒ අනුව, ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සඳහා වන උපදේශන සේවාව 2020 වසරේ 2 වැනි කාර්තුව වන විට අවසන් කිරීමට නියමිතව තිබිණි. කෙසේ වෙතත්, උපදේශන සේවාව සඳහා වන කොන්ත්‍රාත්තුව 2020 පෙබරවාරි 24 වැනි දින ප්‍රදානය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් ඇති විය. | උතුරු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවාව හඳුනාගෙන ඇති අතර, ආසියානු සංවර්ධන බැංකුවේ සහ ජාත්‍යන්තර ලංසු තැබීමේ සවිස්තරාත්මක ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීමෙන් අනතුරුව, එය AECOM වෙත ප්‍රදානය කරන ලදී. ගිවිසුමේ නියම කර ඇති වාර්තාකරණ අවශ්‍යතාවට අනුව, ශක්‍යතා අධ්‍යයන කෙටුම්පත් වාර්තාව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් මාස 13 කට පසුව සම්පූර්ණ කළ යුතුය. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා වගකීම් නියම කරමින් සවිස්තරාත්මක සැලැස්මක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් පිළියෙළ කළ යුතුය. |
| (ආ) | ණය ගිවිසුමේ 4.03 (අ) (v) වගන්තිය සහ ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (v) වගන්තිය | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2020 ජූනි 21 වන දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. ව්‍යාපෘතියේ | COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශය මූල්‍ය වර්ෂය අවසන් වී මාස දෙකක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය. |

| | |
|---|---|
| මුල්‍ය ප්‍රකාශන විගණන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් කාලසීමාවක් ලබා දෙමින් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබූ බව නිරීක්ෂණය වේ. | කිරීමේ සහ අනුමත කිරීමේ ක්‍රියාවලියේ දී සුළු ප්‍රමාදයක් සිදුවී ඇත. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | 2020 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | 2020 දෙසැම්බර් 31 දිනට අත්පත් කර ගත් කාර්යසාධනය ප්‍රතිශතය | විගණන නිරීක්ෂණය | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|
| ආරම්භක වාර්තාව | | 100 | - | |
| අතුරු වාර්තාව | | | - | |
| පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ කෙටුම්පත් වාර්තාව | 100 | 0 | නියමිත කාලසීමාව තුළ අපේක්ෂිත භෞතික කාර්යසාධනය ලබා ගැනීමට නොහැකි විය. | දිවයින තුළ පැවති Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන්. |
| ශක්‍යතා අධ්‍යයනය පිළිබඳ කෙටුම්පත් වාර්තාව | 75 | 0 | | |

| | |
|---|---|
| කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | දිවයින තුළ පැවති Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 ජූනි 10 සිට 2020 නොවැම්බර් 16 දක්වා ව්‍යාපෘතිය නවතා තබන ලදී. |
| විගණකගේ නිර්දේශය | නියමිත කාලසීමාව තුළ භෞතික ප්‍රගතිය ළඟා කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපදේශන සේවාව සඳහා වන කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ උපදේශන වාර්තා තුනක් ඉදිරිපත් කළ යුතු වුවද, පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ කෙටුමපත් වාර්තාව 2020 දෙසැම්බර් 31 දින වන තෙක් අවසන් කර නොතිබුණි. | 2020 මාර්තු මාසයේදී දිවයින තුළ පැවති COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන්, සැලසුම් කළ අන්දමින් උපදේශන කටයුතු කරගෙන යාමට අපහසු විය. Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් අධ්‍යයනය නවතා තිබුණු කාලසීමාව 2020 ජුනි සිට 2020 නොවැම්බර් දක්වා කණ්ඩායම් නායකයින් ශ්‍රී ලංකාවට පැමිණ ව්‍යාපෘතිය අඛණ්ඩව සිදු | ව්‍යාපෘතියේ ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා වාර්තාකරණ අවශ්‍යතා සපුරාලීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කරගෙන යෑමට කටයුතු කරන තෙක් පැවතුණි. යාවත්කාලීන කරන ලද වැඩසටහනට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. | |
| (ආ) | උපදේශන සේවාව සඳහා වන කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, අවසාන ආරම්භක වාර්තාව සහ අතුරු වාර්තාව පිළිවෙලින් සති තුනක් සහ සති අටක් ඇතුළත සේවාලාභියා වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, එකඟ වූ කාලසීමාව තුළ සේවාලාභියා වෙත යොමු කර තිබුණේ කෙටුම්පත් වාර්තා පමණි. තවද, කෙටුම්පත් වාර්තාව මත පදනම්ව, එකඟ වූ ප්‍රගති අදියර සඳහා ගෙවීම් උපදේශකවරයා වෙත නිදහස් කර තිබුණි. | ඉදිරිපත් කරන ලද ආරම්භක සහ අතුරු කෙටුම්පත් වාර්තා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ආසියානු සංවර්ධන බැංකුව මගින් කිසිදු අදහස් දැක්වීමක් සිදු කර නොතිබූ බැවින්, ඒවා පිළිගන්නා ලදී. ඒ අනුව ගිවිසුමට අනුකූලව ගෙවීම් සිදු කරන ලදී. තවද, අවසන් ආරම්භක වාර්තා සහ අතුරු වාර්තා මේ වන විට ලැබී ඇත. | එකඟ වූ කාලසීමාව තුළ අවසන් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3** ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව යටතේ ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීම සඳහා රුපියල් මිලියන 180 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, 2020 වර්ෂය තුළ භාවිතා කර ඇත්තේ රු. මිලියන 21.9 ක් පමණි. | ව්‍යාපෘතිය 2020 ජුනි සිට 2020 නොවැම්බර් දක්වා නවතා තිබුණු අතර උපලේඛනයට අනුව අපේක්ෂිත ගෙවීම් ලබා දී නොතිබුණි. | වර්ෂය තුළ ඇත්ත වශයෙන්ම ඉටු කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳව සලකා බලා වාර්ෂික ඇස්තමේන්තුව සකස් කළ යුතුය. |

**3.4** මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු

ව්‍යාපෘතියේ අනුමත සේවක සංඛ්‍යාව වූ 13 අතරින් ව්‍යාපෘතියේ කාර්යසාධනයට සෘජු බලපෑමක් සිදු කළ හැකි අන්දමේ පුරප්පාඩු 10 ක් පැවතුණි.

**3.5** පද්ධති සහ පාලන

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වගකීම් නියම කරමින් ක්‍රියාකාරකම්, ඉලක්කගත කාලසීමාව, භෞතික හා මූල්‍ය ඉලක්ක ඉස්මතු කෙරෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | ඉදිරියේදී සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට එකඟ විය. | සමාලෝචිත වර්ෂය සඳහා ඉලක්ක සහ ජයග්‍රහණ මැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතිය සඳහා වෙනම බැංකු ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින්, එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ලැබී ඇති ශ්‍රී ලංකා රජයේ (GOSL) අරමුදල් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බැංකු ගිණුම හරහා ලබා දී තිබුණි. | මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති උපදෙස් අනුව, ශ්‍රී ලංකා රජයේ (GOSL) වියදම් උපදේශන සේවා සඳහා පමණක් සහ වැට් බදු ගෙවීම සඳහා පමණක් දරනු ලබන බැවින් එම වියදම් සඳහා ජංගම ගිණුමක් විවෘත කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. එබැවින් වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (SLPA) නමින් චෙක්පත් නිකුත් කර ඇත. | ශ්‍රී ලංකා රජයේ (GOSL) වියදම් දැරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අයත් වෙනම ජංගම ගිණුමක් විවෘත කිරීම වැදගත් වේ. |